**මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - I කොටස - 2017**

**------------------------------------------------------------**

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ I කොටස සඳහා වූ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**------------------------------------------------------------------------------------**

2015 ජුලි 08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි තීරණ අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ හා කිරීමේ නියෝජිතායතන පිළිවෙලින් එවකට මහාමාර්ග වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛණිජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරිය වේ. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අදියර 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘති කටයුතු 2016 දෙසැම්බර් මස 29 දින ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ අතර 2020 අගෝස්තු 31 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. අධිවේගී මාර්ගයේ අදියර 01 යටතේ කඩවත සිට මීරිගම දක්වා කි.මී. 36.59 ක ඉදිකිරීම් කටයුතු සම්බන්ධ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ සඳහන් කරුණු තුළින් උද්ගත වන ගැලපීම්වලින් බලපෑම හැර මා දරන්නා වූ මතය වන්නේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**2.2.1 ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**----------------------------**

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක පදිංචිකරුවන්ට ඉඩම් අත්පත් කර ගැනීම් යටතේ වන්දි වශයෙන් රු.මිලියන 2,832 ක් ගෙවා තිබුණ අතර මෙයින් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් අත්පත් කර ගැනීමට අදාල වවුචර ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් නඩත්තු කරන ලද තොරතුරු සහ අනෙකුත් විස්තර සතුටුදායක ලෙස හෝ පිළිගත හැකි ලෙස විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

2017 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු අනුව ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 5,850 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේ දී මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් රු. මිලියන 2,300 ක මුදලක් මාරු කර තිබුණි. කෙසේ නමුත්, මහා භාණ්ඩාගාරය මඟින් කලට වේලාවට අරමුදල් ලබා නොදීම හා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ නොකිරීම නිසා 2017 දෙසැම්බර් 31 දින වන විට එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 3,073.50 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව, පොතුහැර සිට රඹුක්කන දක්වා වූ අධිවේගී මාර්ග III කොටසේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා 2014 නොවැම්බර් 17 දින විදේශීය ඉදිකිරීම් සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේ වුවද සුදුසු මූල්‍ය මාර්ගයන් සොයා ගැනීමට අපහසුවීම නිසා අදාල ගිවිසුම බල රහිත වී තිබුණි. 2015 ජූලි 06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ ප්‍රකාරව කඩවත සිට මීරිගම දක්වා වූ අධිවේගී මාර්ගයේ I කොටස විශේෂ ඉල්ලීමක් නොමැති කොන්ත්‍රාත්තුවක් ලෙස අධිවේගී මාර්ගයේ III කොටස ඉදිකරන කොන්ත්‍රාත්කරුට සිදුවී තිබූ අලාභ පියවීම සඳහා වන්දියක් ලෙස ප්‍රධානය කිරීමට තීරණය කර තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු යෝජිත කොන්ත්‍රාත් ගිවිසුම බාර ගැනීමේ ලිපිය අත්සන් කර නොතිබුණ බැවින් 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය මඟින් අන්තර් ගෙවීම් සහතික පිළිගෙන නොතිබුණි.

(ආ) සැලසුම් සහ ඉදිකිරීම් අධීක්ෂණ සේවා සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම රු.මිලියන 2,548.92 කට දේශීය බලපත්‍රලාභී වාණිජ බැංකු යටතේ වූ මූල්‍ය පහසුකම් මඟින් ලබාගැනීම යටතේ බද්ධ ව්‍යාපාරයක් වෙත ප්‍රධානය කර තිබුණි. කෙසේ වුවද, භූ තාක්ෂණ පරීක්ෂණ, ආකෘතිමය විස්තරාත්මක සැලසුම් සහ පරීක්ෂණ පිරවීම් යනාදී වැඩ පමණක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආරම්භ කර තිබුණි.

### 3.3 ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු

ලැබී ඇති තොරතුරු අනුව රජයට අයත් ඉඩම් කට්ටි 939ක් සමඟ ඉඩම් කට්ටි 5,159 ක් අධිවේගී මාර්ග I කොටස යටතේ අත්පත් කර ගැනීමට නියමිතව තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට මෙම ඉඩම් කට්ටිවලින් ඉඩම් කට්ටි 1,483 ක් පමණක් අත්පත් කරගෙන රු.මිලියන 2,883 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. කෙසේ වුවත්, එකතු වටිනාකම රු.මිලියන 14 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, ඉඩම් අමාත්‍යාංශය, මිනින්දෝරු සහ තක්සේරු දෙපාර්තමේන්තු යන ආයතනවල සේවකයන් වෙත ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි.

### 3.4 මානව සම්පත් කළමණාකරනය

2017 දෙසැම්බර් 31 දිනට නැවත පදිංචි කිරීමේ නිලධාරි සහ ප්‍රසම්පාදන විශේෂඥ යන තනතුරු පුරප්පාඩුව පැවති අතර මෙම තත්ත්වය ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරීත්වයට බලපා තිබුණි. කෙසේ නමුත් ව්‍යාපෘතිය මඟින් උපදේශකවරුන් 03 දෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවා ගෙන ඒ සඳහා රු.මිලියන 1.10 ක මුදලක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවා තිබුණි.